# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2321/49 - 2023 මාර්තු මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2023.03.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීම (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

**7 වැනි වගන්තිය යටතේ දැන්වීම**

ගොනු අංකය : KEG/LAN/AQU/A3/01/120.
ඉඩම් අමාත්‍යාංශ අංකය : 4-3/03/2019/Z/145.

පින්නවල අලි අනාථාගාරයේ අලි ඇතුන්ගේ අලි අභිජනන මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා අවශ්‍ය පහත සඳහන් ඉඩම් කැබලි අත්පත් කර ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර:*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 12ඒ දියගම ග්‍රාම නිලධාරි වසමේ දියගම ගමේ පිහිටි කෑගල්ල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙළ කරන ලද කැඩැස්තර සිතියම් අංක 610225 දරන පිඹුරේ කැබලි අංක 01 සිට 05 දක්වා ප්‍රමාණයෙන් හෙක්ටයාර 6.7505ක් වන පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලිවලට මායිම්.

01. කැබලි අංක 01
ඉඩමේ නම: පතහමුල්ල, කැකුන්ගේහේන, ගුරුගේහේන, මොරගොල්ලේහේන,කීරඉඹුල්තැන්න, දියන්ගල්ඇන්දහේන, කීරඉඹුල්තැන්න, දොළේහේන වෙලගාවහේන *නොහොත්*, පීල්ලගාවහේන සහ වාගොල්ලේහේන; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 3.0886

*උතුරට*: දියගම (කොටසක්) සහ මාර්ගය; *නැගෙනහිරට*: දියගම (කොටසක්) මාර්ගය, කැබලි අංක 4 සහ කලුගල්ල; *දකුණට*: කලුගල්ල සහ කැබලි අංක 03; *බටහිරට*: කැබලි අංක 03 සහ දියගම (කොටසක්).

02. කැබලි අංක 02
ඉඩමේ නම: -; වර්තමාන ඉඩම් පරිහරණය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0525

*උතුරට*: කැබලි අංක 01; *නැගෙනහිරට*: කැබලි අංක 01; *දකුණට*: කැබලි අංක 01 සහ 03; *බටහිරට*: කැබලි අංක 01 සහ දියගම (කොටසක්)ග

03. කැබලි අංක 03
ඉඩමේ නම: පතහමුල්ල, කැකුලන්ගේහේන, ගුරුගේ-හේන, මොරගොල්ලේහේන, කීරඉඹුල්තැන්න, දියන්ගල්-ඇන්දහේන, කීරඉඹුල්තැන්න, දොළේහේන වෙලගාවහේන *නොහොත්* පීල්ලගාවහේන සහ වාගොල්ලේහේන; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 1.3609

*උතුරට*: කැබලි අංක 01 සහ 02; *නැගෙනහිරට*: කැබලි අංක 01; *දකුණට*: කැබලි අංක 01 සහ කලුගල්ල; *බටහිරට*: කලුගල්ල සහ දියගම.

**04. කැබලි අංක 04**

ඉඩමේ නම: -; වර්තමාන ඉඩම් පරිහරණය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0134

*උතුරට*: කැබලි අංක 01 දියගම (කොටසක්) සහ කැබලි අංක 05; *නැගෙනහිරට*: දියගම (කොටසක්) සහ කැබලි අංක 05; *දකුණට*: දියගම (කොටසක්); *බටහිරට*: කැබලි අංක 01 සහ දියගම (කොටසක්).

**05. කැබලි අංක 05**

ඉඩමේ නම: පතහමුල්ල, කැකුලන්ගේහේන, ගුරුගේහේන, මොරගොල්ලේහේන, කීරඉඹුල්තැන්න, දියන්ගල්ඇන්දහේන, කීරඉඹුල්තැන්න, දොළේහේන වෙලගාවහේන *නොහොත්,* පිල්ලගාවහේන සහ වාගොල්ලේහේන; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 2.2351

*උතුරට*: දියගම (කොටසක්); *නැගෙනහිරට*: දියගම (කොටසක්); *දකුණට*: කලුගල්ල; *බටහිරට*: කලුගල්ල, දියගම (කොටසක්) සහ කැබලි අංක 04.

ඉහත සඳහන් ඉඩමට/පරවශාතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 මාර්තු මස 29 වැනි දින පෙ.ව. 10.00 ට කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2023 මාර්තු මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශාතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 2 ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**කේ. ජී. එස්. නිශාන්ත,**
ප්‍රාදේශිය ලේකම්,
කෑගල්ල.

2023 පෙබරවාරි මස 27 වැනි දින,
කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03-0003

---

ශුද්ධි පත්‍රිකාවයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**7 වැනි වගන්තිය යටතේ දැන්වීම**

2022 නොවැම්බර් මස 03 වැනි දින අංක 2304/48 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* III කොටස ඉඩම් යටතේ පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීමෙහි සඳහන් හිමිකම් පරීක්ෂණ දිනය 2022.10.21 ලෙස ද අයිතිවාසිකම් පිළිබඳ තොරතුරු ඉල්ලා සිටීමේ දිනය 2022.10.14 ලෙස ද සඳහන් වේ. එම දිනයන් පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ.

| | | |
|---|---|---|
| පෙනී සිටිය යුතු දිනය | : | 2023.03.23 |
| තොරතුරු ඉල්ලා සිටිය යුතු දිනය | : | 2023.03.16 |

තවද, ඉහත කී *අති විශෙෂ ගැසට් පත්‍රයේ* මාගේ නිල නාමය ජේ. එම්. හද්‍රානි ජයවර්ධන, කොළඹ මහා නගර සභාව සහ කොළඹ මහා නගර සභා බල සීමාව තුළ ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි ලෙස සඳහන් වුවද එය ඉවත් කොට ඒ වෙනුවට ජේ. එම්. හද්‍රානි ජයවර්ධන, නාගරික කොමසාරිස්, කොළඹ මහා නගර සභාව සහ කොළඹ මහා නගර සභා බල සීමාව තුළ ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි ලෙස ආදේශ කිරීමෙන් එම දැන්වීම සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| ඉවත් කළ යුතු තනතුරු නාමය | : | ජේ. එම්. හද්‍රානි ජයවර්ධන, කොළඹ මහා නගර සභාව සහ කොළඹ මහා නගර සභා බල සීමාව තුළ ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි. |
| ඉවත් කළ යුතු තනතුරු නාමය වෙනුවට ආදේශ කළ යුතු තනතුරු නාමය | : | ජේ. එම්. හද්‍රානි ජයවර්ධන, නාගරික කොමසාරිස්, කොළඹ මහා නගර සභාව සහ කොළඹ මහා නගර සභා බල සීමාව තුළ ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි. |

**ජේ. එම්. හද්‍රානි ජයවර්ධන,**
නාගරික කොමසාරිස්,
කොළඹ මහා නගර සභාව සහ
කොළඹ මහා නගර සභා
බල සීමාව තුළ ඉඩම්
අත්කර ගැනීමේ නිලධාරි

EOG 03-0004

---

ශුද්ධි පත්‍රිකාවයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**7 වැනි වගන්තිය යටතේ දැන්වීම**

මගේ අංකය : THI/LND/L2/ACQVI/119.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/09/2014/WS/02.

තිහගොඩ ප්‍රාදේශීය ලේකම් දුමින්ගු හේවාගේ උදයාන්ගනී සඳමාලි වන මම මාතර IV වන අදියර ජල යෝජනා ක්‍රම යටතේ ගල්කැටිය භූගත ජලාශය හා ස්ථාන භාරකරු නිල නිවාසය ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීමට අදාළව නිකුත් කරන ලද 2021.04.06 දිනැති අංක 2222/30 හා 2021.10.12 දිනැති අංක 2249/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* ප්‍රකාශයට පත් කරන ලද 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ ගැසට් නිවේදනයේ ශුද්ධි පත්‍රිකාව හිමිකම් පරීක්ෂණ දිනය 2023.03.23 දින ලෙස ද, ඊට අදාළ ලියකියවිලි ඉදිරිපත් කළ යුතු දිනය 2023.03.20 දින ලෙස හා අත්කර ගන්නා ඉඩමට අදාළ මූලික පිඹුරු අංකය 2909 ලෙසද ඉඩම් කැබලි අංකය 01 ලෙස ද එකී බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.1260ක් ලෙස ද සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**ඩී. එච්. යූ. සඳමාලි,**
ප්‍රාදේශීය ලේකම්/ ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
තිහගොඩ.

2023 පෙබරවාරි මස 27 වැනි දින,
තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03-0005

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.